# ශ්‍රී ලංකා නාවික හමුදා සංගමයේ සාමාජිකත්වය සඳහා හිමිවන ප්‍රතිලාභ හා දීමනා වරප්‍රසාද

| | | |
|---|---|---|
| 1. | හෘද සැත්කම් සහ පිළිකා රෝග සඳහා දීමනාව. **(වසරකට වරක්)** | රු. 40,000.00 |
| 2. | අවමංගල්‍ය ආධාර පරිත්‍යාග මුදල. | රු. 30,000.00 |
| 3. | ඇස් කණ්නාඩි සඳහා දීමනාව. **(වසර දෙකකට වරක්)** | රු. 1,000.00 |
| 4. | ඇසේ සුද ඉවත් කිරීමේ ශල්‍යකර්මය සඳහා දීමනාව. **(එක් ඇසකට එක් වරක් පමණි)** | රු. 2,000.00 |
| 5. | ශ්‍රවණාධාර සඳහා දීමනාව. **(වසර දෙකකට වරක්)** | රු. 2,000.00 |
| 6. | පූර්ණ අකර්මණ්‍යතාවය සඳහා දීමනාව. **(දෙඅත්,දෙපා,දෑස් අහිමිවීම හෝ සදාකාලික අංශභාග තත්වයන් සඳහා වසරකට වරක්)** | රු. 7,000.00 |
| 7. | අර්ධ අකර්මණ්‍යතාවය සඳහා දීමනාව. **(එක් අතක් හෝ එක් පාදයක් හෝ එක් ඇසක් අහිමි වීම හෝ තාවකාලික අංශභාග තත්වයන් සඳහා වසරකට වරක්)** | රු. 3,000.00 |
| 8. | රුධිර කාන්දුකරනය සඳහා. **(මසකට වරක්)** | රු. 2,000.00 |
| 9. | එන්ජියෝ ග්‍රෑම් හෝ බරපතල සැත්කම් සඳහා. | රු. 25,000.00 |
| 10. | ඉහත රෝගී තත්වයන්ට අයත් නොවන මාරාන්තික අසනීප සඳහා. | රු. 25,000.00 |
| 11. | නාවික රෝහල්වල නේවාසික/බාහිර ප්‍රතිකාර පහසුකම්. **(විශ්‍රාම වැටුපක් හෝ සේවා විශ්‍රාම වැටුපක් හෝ ආබාධිත විශ්‍රාම වැටුපක් ලබන නාවික පුද්ගලයින්)** | |
| 12. | නාවික මහ රෝහලට යොමු කිරීමෙන් පසු කොළඹ යුධ හමුදා රෝහලෙහි නේවාසික පහසුකම් ලබාදීම. | |
| 13. | නාවික නිවාඩු නිකේතන පහසුකම්. | |
| 14. | විශ්‍රාම වැටුප් ලාභීන්ගේ ඝණයට නොවැටෙන වසර දොලහක මූලික සේවා කාලය සම්පූර්ණ කල සාමාජිකයින්ගේ අවමංගල්‍ය කටයුක්තකදී රුපියල් 15000.00 කට නොඅඩු ආධාර මුදලක් පිරිනැමීමට ශ්‍රී ලංකා නාවික හමුදා සුභ සාධක අංශය කටයුතු කරනු ලැබේ.එසේ දක්වා ඇති මුදල පිරිනමනු ලබන්නේ අවමංගල්‍ය පහසුකම් වෙනුවෙන් මඩු, පුටු නෙස්කැපේ යන්ත්‍ර කුලී පිට ගැනීම සඳහා මතු කියවූ මුදල ප්‍රධානය කරනු ලැබේ. | |

## ශ්‍රී ලංකා නාවික හමුදා සංගමයේ සාමාජිකයින් සහ සේවයේ නාවික පුද්ගලයන් සඳහා නේවාසික පහසුකම් ලබාදීම

ශ්‍රී ලංකා නාවික හමුදා සංගමයේ සාමාජිකයින්ගේ සුභසාධනය වෙනුවෙන් වැලිසර නාවික හමුදා පරිශ්‍රය තුල ඉදිකර ඇති ශ්‍රී ලංකා නාවික හමුදා සංගම් ලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ සියළු පහසුකම් වලින් සමන්විත කාමර 9 ක් ඉදිකර ඇත. මෙම කාමර නාවික මහ රෝහලෙන් ප්‍රතිකාර ලබා ගැනීමට පැමිණෙන සහ දුර බැහැර සිට කොළඹට පැමිණෙන නාවික හමුදා සංගමයේ සාමාජික සාමාජිකාවන්හට ප්‍රමුඛතාවය මත ලබා දීමට කටයුතු කරන අතර (නාවික මහ රෝහලෙන් ප්‍රතිකාර ලබා ගැනීමට පැමිණෙන සාමාජිකයන්) හට ආහාර පාන ඇතුළුව කාමරයක් දිනකට රු.1,000.00 ක ගාස්තු යටතේ වෙන් කර දීමට තීරණය කර ඇත.

## ශ්‍රී ලංකා නාවික හමුදා සංගමයේ සාමාජිකයින් සඳහා නිවාඩු නිකේතන වෙන් කර ගැනීම

ශ්‍රී ලංකා නාවික හමුදා සංගමයේ සාමාජිකයින් සඳහා නාවික නිවාඩු නිකේතන පහසුකම් වෙන් කිරීමේදි දියතලාව/කතරගම/අනුරාධපුරය සහ සියළුම නාවික විධානයන් යටතේ ඇති නිවාඩු නිකේතන වෙන් කර ගත හැකි අතර එම නිකේතන වෙන් කිරීමේදි (නාවික හමුදා මූලස්ථානයේ ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛම් කාර්යාලය වෙතින් වෙන් කිරීම සිදු කර) මසකට පෙර නාවික හමුදා සංගමයේ ඇති අයදුම්පත පුරවා ලබා දිය යුතු අතර, වැඩි විස්තර දැන ගැනීම සඳහා දු.ක 011-7193971 අමතා ලබාගත හැක.(කතරගම නිවාඩු නිකේතනය වෙන් කර ගැනීමේදි අය කර ගන්නා කුලී මුදල ශ්‍රී ලංකා නාවික හමුදා බෞද්ධ සංගමයේ ගිණුම වෙත බැර කළ යුතුය.

## බිරිඳ සහ පවුලේ අයවලුන් විසින් දැනුවත් විය යුතු කරුණු කාරණා

ශ්‍රී ලංකා නාවික හමුදාවට බැඳී විවාහ දිවියට පත්වූ දරුවන් ලැබ විශ්‍රාම ලබා සිටිනා අප කවුරුත් තම බිරිඳ සමඟ සියළුදේ ගැන කථා කළත් ඇය අකමැති මෙන්ම කථා කිරීමට ඉඩ ප්‍රස්ථා නොදෙන විෂයක් වන්නේ ස්වාමිපුරුෂයාගේ මරණය සහ ඉන්පසු බිරිඳ හෝ දරුවන් විසින් ගත යුතු ක්‍රියා මාර්ග මොනවාද යන්න ගැන කථා කිරීමටයි.

කොපමණ අකමැති වුවත් අප බිරින්දෑවරුන් මේ සම්බන්ධයෙන් දැනුවත් විය යුත්තේ ඇයට අනිවාර්යෙන් මුහුණදීමට සිදුවන එවැනි මොහොතකදි ගත යුතු ක්‍රියා මාර්ගයන් ක්‍රමවත් කිරීමට උපකාරී වන හෙයිනි. අප මෙහි සඳහන් කිරීමට බලාපොරොත්තු වන්නේ ශ්‍රී ලංකා නාවික හමුදා සංගමයෙන් සහ ශ්‍රී ලංකා නාවික හමුදාවෙන් ඉටු කරගත යුතු කාර්යන් සම්බන්ධයෙන් දැනුවත් කිරීමකි.